# සාමාන්‍ය සමයේ විසිසත්වන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

මලාකි දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

මලාකි **3 : 13 – 18**

"උන් වහන්සේ පැමිණීමේ දවස උහුලන්න පුළුවන් කවරෙකුට ද?"

සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක. "නුඹලා මට විරුද්ධව නපුරු දේ කියා ඇත. එසේ වුවත් 'අපි ඔබට විරුද්ධව කුමක් කීවෙමු දැ'යි නුඹලා අසන්නහු ය. දෙවියන් වහන්සේට සේවය කිරීම නිෂ්ඵල ය. උන් වහන්සේගේ ආඥා ඉටු කිරීමෙන් වත්, කණගාටු වීමෙන් වත් සියලු බලැති සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි හැසිරීමෙන් වත් වැඩක් ඇද්ද? අපට පෙනෙන හැටියට නම් වාසනාව ඇත්තේ උඩඟු අයට ය. දියුණු වන්නේ නපුරුකම් කරන අය ය. ඔව්හු දෙවියන් වහන්සේ පරීක්ෂා කරතත් නිදහස් ව සිටිති යි නුඹලා කියන්නහු ය."

එකල සමිඳාණන් වහන්සේට ගරු බිය දැක්වූ අය එකිනෙකා සමඟ කතා කරගත් විට සමිඳාණන් වහන්සේ ඔවුන් කී දේට සවන් දුන් සේක. සමිඳාණන් වහන්සේට බිය වන්නා වූ ද උන් වහන්සේට ගෞරව කරන්නා වූ ද අය සම්බන්ධයෙන් උන් වහන්සේ ඉදිරියේ පොතක සටහනක් ලියන ලද්දේ ය. සියලු බලැති සමිඳාණන් වහන්සේ කී දේ ඒ පොතේ මෙසේ සටහන් කර ඇත. "ඔව්හු මාගේ සෙනඟ වන්නෝ ය. මා ක්‍රියා කරන දවසේ දී ඔව්හු මාගේ ම විශේෂ උරුමය වන්නෝ ය. පියෙකු තමාට සේවය කරන පුත්‍රයාට කරුණා කරන්නාක් මෙන් මම ඔවුන්ට කරුණාව දක්වන්නෙමි. එකල ධර්මිෂ්ඨයා හා දුෂ්ඨයා අතරේ ද

දෙවියන් වහන්සේට සේවය කරන්නා හා උන් වහන්සේට සේවය නොකරන්නා අතරේ ද ඇති වෙනස නුඹලා දකිනු ඇත.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 1: 1-6

පිළිතුර: සමිඳුන් අදහන්නෝ ආසිරි ලද්දෝ ය.

ගීය:

දුදනන් උපදෙස් අනුව නොයන, දෙවිඳුන් ගරහන්නන් ඇසුරු නොකරන, සමිඳුන්ගේ විනයෙහි ප්‍රීති ප්‍රමුදිත වන, දිවා රෑ එය භාවනා කරන මිනිසා භාග්‍යවන්තයෙක් වන්නේ ය.

ඔහු ඇළ දොළ අද්දර සිටුවා ඇති, නියම කලට පල දරන, කොළ පරවී නොයන ගසකට සමාන ය. ඔහු කරන සැම දේ සරු සාර වේ. පව්වු දනෝ එසේ නොවෙති. ඔව්හු සුළඟේ යන බොල් හා සමාන වන්නෝ ය.

විනිසය එන දා දුදනන්ට නම් වරද පැවරේ. දමිටුන් සමඟ ඔවුන්ට ගැවසුම් නැත්තේ ය. දමිටුන් හට සමිඳාණෝ සරණ වන සේක. පව්වුන්ගේ මාර්ගය විනාශයට යන්නේය.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
"මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි.
මා මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නෝ ය"යි සමිඳාණෝ වදාරන සේක.

ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"සමිඳුනි, ඔබගේ පුත්‍රයාණන්ගේ වචන පිළිගැන්මට අප සිත් පැහැද වූව මැනව."

ආලේලූයා!

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 11: 5–13

"සොයන්න ඔබට සම්බ වේ. තට්ටු කරන්න, ඔබට දොර හරිනු ලැබේ.?"

තවද, උන්වහන්සේ ඔවුන්ට කතා කරමින් "ඔබ අතර මිතුරකු ඇති තැනැත්තෙක් මහ රෑ ඔහු වෙත ගොස්, මිත්‍රය, මට රොටි තුනක් දෙන්න. ගමනක් යන මාගේ මිත්‍රයෙක් මා වෙත අවුත් සිටියි. ඔහුට දෙන්නට කිසිවක් මා ළඟ නැතැ"යි කියත්තේ නම් ගේ ඇතුළේ සිට ඒ මිතුරා උත්තර දෙමින් "මට කරදර නොකරන්න. දැන් දොර වසා තිබේ. මාගේ දරුවෝ ද මා සමග ඇඳේ නිදා සිටියි. නැගිට යමක් ඔබට දෙන්නට නොහැකි යයි කියයි ද? මම ඔබට මෙය කියමි. ඔහු සිය මිත්‍රකම සලකා නැගිට ඔහු ඉල්ලන දේ ඔහුට නොදෙනත් ඔහුගේ ලජ්ජා නැති පෙරැත්තය නිසා නැගිට, වුවමනා පමණ ඔහුට දෙනු ඇතැ"යි වදාළ සේක.

මම ද ඔබට කියමි. ඉල්ලන්න ඔබට දෙනු ලැබේ. සොයන්න ඔබට සම්බ වේ. තට්ටු කරන්න. ඔබට දොර හරිනු ලැබේ. මන්ද ඉල්ලන හැමට ලැබේ. සොයන්නාට සම්බ වේ. තට්ටු කරන්නාට දොර හරිනු ලැබේ. ඔබ අතරෙන් කවර පියෙක් තම පුත්‍රයා මාළුවකු ඉල්ලූ විට මාළුවා වෙනුවට සර්පයෙකු දෙයි ද? නොහොත් බිත්තරයක් ඉල්ලූ විට ඔහුට ගෝනුස්සකු දෙයි ද? මෙසේ අයහපත් වූ ඔබ ඔබේ දරුවන්ට යහපත් දේ දෙන්නට දන්නාහු නම්, ඊට කොපමණ වැඩියෙන් ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ තමන් වහන්සේගෙන් ඉල්ලන්නන්ට ශුද්ධාත්මයාණන් නොදෙන සේක් ද?

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.